KIDS GOD WORSHIP

www.kidworship.kr



75Page



76Page



77Page



78Page



79Page

# ලාසරස් නම් හිඟන්නා

-The Beggar Lazarus-

බොහෝ කාලයකට ඉහතදී ගොඩක් පොහොසත් මිනිසෙක් සිටියා. හරිම ලස්සන ගෙදරක තමයි ඔහු ජීවත්වුණේ. මිල අධික ඇඳුම් තමයි ඇන්දේ. මේ විදිහට ඔහු හැමදාම ඉතාම හොඳට කමින් බොමින් සැපට ජීවත්වුණා. මේ පොහොසත් මිනිසා හැමදාම වගේ තමන්ගේ ගෙදරට මිතුරන්ට එන්නට කියා සාදයන් පවත්වනවා. මෙහෙම ඔහු හැමවිට-කම සතුටින්-ප්‍රීතියෙන් ජීවත්වුණා.

---

ඒ පොහොසත් මිනිසාගේ නිවස ඉදිරිපිට ලාසරස් නම් දුප්පත් හිඟන්නෙක් සිටියා. පො-හොසත් මිනිසාගේ ගේට්ටුව ඉදිරියේ සිටි මේ හිඟන්නාගේ මුලු ශරීරයේම තුවාල දාලා තිබුණා. මේ හිඟන්නා කිළිටි ඇඳුම් හැඳ සිටි අතර, පොහොසත් මිනිසාගේ කෑම මේසය යටට වැටෙන කෑම කැබලි කාලා ජීවත් වුණා. මන්ද කීවොත් එයා හරිම කිළිටි සහ ගඳ කෙනෙක් නිසා, ඒ වගේම එයා කිසිවක් ලබන්න තරම් සුදුස්සෙක් ය කියා කවුරුත් සිතුවේ නෑ. ඒ වුණත් ! ලාසරස් දෙවියන්වහන්සේ විශ්වාස කළා, ඔහු ඇදහිල්ලේ මිනිසෙක්...

---

කාලය යද්දී දවසක් ලාසරස් නම් හිඟන්නා මැරුණා. එවිට දේවදූතයන් ඇවිත් ලාසරස්ව ඔසවාගෙන ගෙනගොස් ආබ්‍රහම්ගේ අතේ තැබුවා. ආබ්‍රහම් තමුනගේ ඇදහිල්ල ගැන ගරු බුහුමන් ලැබූ කෙනෙක්. ඔහු අපේ ඇදහිල්ලේ පියා ද වෙනවා.

---

ඊට ටික කාලයකට පසුව, පොහොසත් මිනිසාත් මැරී වළලනු ලැබුවා. ඊට පස්සේ එයා අපායට වැටුණා, ගොඩක් එහි දුක් වේදනා වින්දා. අපෝ !! අපාය කෙළවරක් නැති නෙ-ානිවෙන ගින්නේ සාගරයක්. පොහොසත් මිනිසා වේදනාවෙන් කෑ ගහමින් යමින්, එයාගේ වියළුණු උගුර තෙමාගන්නට වතුර ටිකක් ඉල්ලනවා. ඔහු වේදනාවෙන් සිටින ගමන් ඉහළ බැලුවා. එතකොටම එයා ඈත ස්වර්ගය දැක්කා.

පොහොසත් මිනිසා - " මොකක් ! මෙහෙම කොහොමද වෙන්නේ, අර ලාසරස් නම් හිඟන මනුෂ්‍යා, අපේ ඇදහිල්ලේ පියා වන ආබ්‍රහම්ගේ ඉන්නේ කොහොමද? "

පොහොසත් මිනිසා තිගැස්සුණා. ... ! පොහොසත් මිනිසා ලාසරස් ගැන ගොඩක් ඊර්ෂ්‍යා වුණා... ඔහු දැන් පිය වූ ආබ්‍රහම්ට කෑ ගහලා කතා කරනවා.

"පිය වූ ආබ්‍රහම්... මාව බේරගන්න... මගේ මුලු ශරීරරයම ගින්දරෙන් පිච්චෙනවා. ඒක ගොඩාක් රස්නෙයි. ලසරස්ගේ ඇඟිල්ල වතුරක බහා, මගේ දිව සිසිල් කරන්න අනේ කරුණාකරලා ලාසරස් ව එවන්න. මම මේ ගින්දරේ වේදනාවෙන් ඉන්නේ ..."

"ආබ්‍රහම් උත්තර දෙමින්, පුත්‍රය... ලාසරස්ට ඔබ ළඟට එන්න බෑ. මතක තියා ගන්න. ඔයාගේ ජීවිත කාලේම ඔයාට හොඳ දේවල් ලැබුණා. ඔයා ඔයාගේම සතුටට ජීවත් වුණා. ඒත් ලාසරස්ට ලැබුණේ හරිම නරක දේවල්. එයා ජීවත් වුණේ බඩගින්නෙන් සහ වේදනා-වෙන්. ඒත් දැන් එයා මෙතැන සැනසිල්ලේ ඉන්නවා. ඔබ අපායේ දුක් විඳිනවා..

ඒක එහෙම වුණත් අනිත් දේ තමයි, ඔයාලා සහ අපි අතරේ විශාල කුහරයක් තියෙනවා. අපිට ඔයාලා ළඟට එන්නත් බෑ, ඔයාලට අපි ළඟට එන්නත් බෑ. "


80Page


81Page

-දුකින් මේ මිනිසා ආබ්‍රහම්ගෙන් ඉල්ලනවා,-

"අනේ එහෙනම් මම වැඳලා කියන්නම්, මගේ පවුලේ අයයි, සහෝදරයෝයි මේ වගේ දුක් විඳන තැනකට නොඑන පිණිස ඔවුන් අනතුරු අඟවන්න, ලාසරස්ව මගේ තාත්තාගේ ගෙදරට යවන්න."

"ආබ්‍රහම් උත්තර දෙමින්, එයාලට මෝසෙස් සහ අනාගතවකතෘන් ඉන්නවා. එයාලා ඔවුන්ට ඇහුම්කන් දෙයි. ඒක විශ්වාස නොකළොත් කෙනෙක් මළවුන්ගේ නැඟිට ගොස් කීවත් ඔවුන් විශ්වාස කරන්නේම නෑ."

මේ පොහොසත් මිනිසා නැවතත් ආබ්‍රහම්ගෙන් අයැදිනවා,

"නෑ.. පියාණෙනි, මළවුන්ගෙන් යමෙක් ඔවුන් අතරට ගොස් කීවොත් ඔවුන් විශ්වාස කර පසුතැවිලි වෙයි. ඒ නිසා අනේ... කරුණාකර එයාලට උදව් කරන්නකෝ "

ආබ්‍රහම් පොහොසත් මිනිසාට කතා කොට,

"විය යුත්තේ එසේ නොවයි. එයාලා දැනටමත් ජීවත්වෙලා ඉන්න අයගේ සාක්ෂියට ඇහුම්කන් නොදෙයි නම්, මළවුන් අතරෙන් කෙනෙක් ගිහින් අපාය කොයිතරම් භයානකයිද කියා ඔවුන් ඒක විශ්වාස කොට පසුතැවිලි වෙන්නේ නෑ. එනම් ඔවුන් දෙවියන්වහන්සේව විශවාස නොකරයි. ඒ නිසයි ඔයාලා ජීවත්වෙලා ඉද්දී දේව වචනය අසා පසුතැවිලි වීම වැදගත් වන්නේ. "

පොහොසත් මිනිසා ජීවත්වෙලා සිටියදී ලාසරස්ට උදව් කළේ නෑ. එයාගේ අසල්වාසීන්ට ප්‍රේමකරන්නේ කොහොමද කියාවත් ඔහු දැනගෙන සිටියේ නෑ.

........................................................................................................

මේ පොහොසත් මිනිසා වගේ අපද, අපේ අසල්වාසියාට ප්‍රේම නොකරයි නම්, අපි දෙවියන්වහන්සේගේ සෙනගක්ය කියා කීමට නොහැකිය. මක්නිසාද දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නේ කොහොමද කියාත්, අපට මෙන්ම අපේ අසල්වාසීන්ට ප්‍රේමකරන්නේ කොහොමද කියාත් යේසුස්වහන්සේ අපට උගන්වා තිබේ.

ජීවිතයට අදාල කිරීම - දුවේ පුතේ, අපිත් යේසුස්වහන්සේ දැනගෙන හොඳ සතුටින් ජීවත්වෙනවද? ඒත් බලන්න අපේ නිවෙස් වටේට ඉන්න අය. අසරණයන්, හිඟන්නන්, දුප්පත් දරුවන්, බඩගින්නේ ඉන්න අය, මේ අයට අපි මොනවද කරන්නේ ? ඒ අයට ආදරය කරන්න සලකන්න ඕන නේද? එහෙනම් අදම යමක් කරන්න හිතන්න.